# 2019.02.22 වන දින පෙ.ව. 10.00ට සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී පවත්වන ලද කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

සහභාගී වූ :

| | | |
|---|---|---|
| 1. ගරු කාරක සභා සභාපති | - | ලියනගේ චන්දන කුමාර මැතිතුමා. |
| 2. ගරු කාරක සභික | - | සෝමසිරි ජයන්ත රණවක මැතිතුමා. |
| 3. ගරු කාරක සභික | - | සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා. |
| 4. ගරු කාරක සභික | - | එල්. නන්ද කුමාරසිංහ මැතිතුමා. |
| 5. ගරු කාරක සභික | - | පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා. |
| 6. ගරු කාරක සභික | - | කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා |
| 7. ගරු කාරක සභික | - | එච්.පී. උපුල් ප්‍රසන්න මැතිතුමා. |
| 8. ගරු කාරක සභික | - | ඩබ්. අසෝක වැලිකල මැතිතුමා. |
| 9. ගරු කාරක සභික | - | ජී. කුමුදිනී ජයවර්ධන මැතිතුමිය. |
| 10. ගරු කාරක සභික | - | එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය. |

සහභාගී -නොවූ :

| | | |
|---|---|---|
| 1. ගරු කාරක සභික | - | එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා. |

සහභාගී වූ නිලධාරීන් :

| | | |
|---|---|---|
| 1. ප්‍රධාන කළමනාකරණ සහකාර | - | කේ.ඩී. සන්ධ්‍යා මාලනී මිය |
| 2. වැඩ අධිකාරී | - | ජයන්තා ජල්තොටගේ මිය |
| 3. කාර්යභාර නිලධාරී - පාදුක්ක | - | ඩී.සී.ජේ. අමරසිංහ මිය. |
| 4. කාර්යභාර නිලධාරී- කහහේන | - | ජී. චමරි පත්මලතා මිය |
| 5. සංවර්ධන නිලධාරී | - | ඩී.ජී. ඉෂානි කමලිකා මිය |
| 6. තාක්ෂණ නිලධාරී - කොස්ගම | - | එන්.පී. දිවිගල්පිටිය මිය. |
| 7. තාක්ෂණ නිලධාරී - හංවැල්ල | - | එල්.ඒ. ධර්මසේන මයා. |
| 8. තාක්ෂණ නිලධාරී - පාදුක්ක | - | එන්.ඩී. හෙට්ටිආරච්චි මිය. |

කාරක සභාව සඳහා පැමිණි සියලුදෙනා සාදරයෙන් පිළිගත් ගරු සභාපතිතුමා කාරක සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. පෙර කමිටුවේ ප්‍රගතිය.

1. **2018.11.23** දින පැවති කාරක සභාවේ තීරණ අංක **01 – (02)** යටතේ දැක්වෙන "ප්‍රාදේශීය සභාව සතු ඉසුරු මාවත සම්බන්ධවයි" යන හිසින් යුතුව ඉදිරිපත් කරන ලද ලිපිය සඳහා හංවැල්ල තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව ගැසට් කරන ලද පළල ප්‍රමාණයන් භෞතිකව නොමැති

බැවින් මෙම මාර්ගය සඳහා ඉඩම් ලබාදුන් ඉඩම් හිමියන් කැඳවා **2019.02.07** දින පෙ.ව. **10.00** ට කැඳවා සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී පාර්ශවකරුවන් මාර්ගයේ මැද සිට දෙපැත්තට ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා අඩු ස්ථානයන්හි පිහිටි ඉඩම් හිමියන්ගෙන් අඩු ප්‍රමාණය ලබාදීමට එකඟතාවය ලබාදෙන ලදි.

**2.** **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **01 – (02)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා මැතිතුමිය විසින් **2018.11.22** දිනැතිව යොමුකරන ලද ලිපිය සම්බන්ධයෙන් **2019.01.11** දින පෙ.ව. **10.00** ට ස්ථානීය පරීක්ෂණයක් පැවැත්වූ අතර එහිදී අවුරුදු **70** ක පමණ සිට නිවාස **06** කට පමණ ප්‍රවේශය ලබන අඩි **08** ක් පළල ඉතා දුෂ්කර මාර්ගයක් වන මෙම මාර්ගය වර්තමානයේ වැලිබල් ප්ලාන්ටේෂන් ආයතනයට අයත් වන අතර එම සමාගම විසින් මෙම මාර්ගය වසා ඇති බැවින්, මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා **2019.02.07** දින පෙ.ව. **10.00** ට සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී මාර්ගයට දමා ඇති ගේට්ටුවට පැය **24** ම ආරක්ෂක නියාමකයෙකු යෙදවීමටත්, මෙම මාර්ගය භාවිත කරන පෞද්ගලික ඉඩම් හිමියන්ගෙන් හිමිකම් පත්‍ර ලබාදෙන ඒවා පාලන අධිකාරිය වෙත ඉදිරිපත් කර මාසයක් ඇතුළත තීරණය කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමටත් එකඟතාවය පලකරන ලදි.

**3.** **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **01 – (21)** යටතේ දැක්වෙන "සීතාවක ප්‍රාදේශීය සභාවේ අවසරයකින් තොරව ඉඩමක් වෙන්දේසි කිරීම හා ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධවයි" යන හිසින් යුතුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා විසින් **2018.12.23** දිනැතිව යොමුකරන ලද ලිපිය සම්බන්ධයෙන් **2019.01.11** දින පෙ.ව. **10.00** ට ස්ථානීය පරීක්ෂණයක් පැවැත්වූ අතර එහිදී ඉඩම් වෙන්දේසිකරු වන මාලබේ, තලාහේන, මුල්ලේරියාව පාර, අංක **51** හි පදිංචි ලයනල් කරුණාරත්න මහතා **2019.02.07** දින පෙ.ව. **11.00** ට කැඳවා සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී සැලසුම් කමිටු විසින් ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට එකඟතාවය පලකරන ලදි.

**4.** **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **01 – (31)** යටතේ දැක්වෙන පාදුක්ක, උතුරු අරුක්වත්ත, අංක **274/ඒ/2** හි පදිංචි පී.ඒ. විදුලා කුමාරි මහත්මිය විසින් "වැසි ජල මාර්ගයක් අවහිර කිරීම සම්බන්ධව" යන හිසින් යුතුව **2018.11.29** දිනැතිව යොමුකරන ලද ලිපිය සම්බන්ධයෙන් **2019.01.11** දින පෙ.ව. **10.00** ට ස්ථානීය පරීක්ෂණයක් පැවැත්වූ අතර එහිදී මෙම ගැටළුව විසඳීම සඳහා වාචිකව එකඟ වූ අතර එකඟ වූ පාර්ශවයන් **2019.02.07** දින පෙ.ව. **10.00** ට කැඳවා සාකච්ඡා කර දෙපාර්ශවයෙන්ම **6"** බැගින් තමන්ගේ මායිමේ කාණුවක් සකස් කිරීමට එකඟතාවය ලිඛිතව ලබාදුන් අතර **2019.02.22** දින නැවත කාරක සභාවට පැමිණ මෙම ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡා කළ බැවින් වැඩ අධිකාරීතුමිය විසින් පරීක්ෂා කර බලා නැවත වාර්තාවක් ලබාදෙන ලෙසට දන්වා සිටින ලදි.

**5.** **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (02)** යටතේ දැක්වෙන **"අනු අංක 163 - බ්‍රැන්ඩිගම්පල - කළු කන්ද මාර්ගය අබලන් කරවීම සම්බන්ධයෙනි."** යන හිසින් යුතුව **2019.01.09**

දිනැතිව වග, කළුඅග්ගල, බ්‍රැන්ඩිගම්පල හරහා, කළු කන්ද හි පදිංචි විමලසිරි හේවාවසම් (ඇතුළු ගම්වාසීන්) විසින් යොමුකරන ලද ලිපිය සඳහා හංවැල්ල තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව සීලෙක්ස් ඉංජිනියරින් ප්‍රයිවෙට් ලිමිටඩ් (Ceylex Engineering Pvt. Ltd.) සමාගමේ බර වාහන ගමන් කිරීම හේතුවෙන් මාර්ගය අබලන්ව ආරම්භයේ සිට දෙවන බෝක්කුව ගිලා බැස ඇති අතර, මෙම මාර්ගය සකස් කිරීම සඳහා රු. 752,114.24 ක මුදලක් වැය වන බවට ද ඇස්තමේන්තු කර ඇති බැවින් ඇස්තමේන්තුවේ පිටපතක්ද සමඟ මාර්ගය සකස් කරදෙන ලෙස දන්වා විදුලිබල මණ්ඩලයට ලිපියක් යැවීමට තීරණය කරන ලදි.

6. 2019.01.24 දින පැවති කාරක සභාවේ තීරණ අංක 02 – (03) යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද චන්ද්‍රසිරි මැතිතුමා විසින් "මාර්ගය අවහිර වී ඇති ටෙලිෆෝන් කණු ඉවත් කිරීම සම්බන්ධයෙනි." යන හිසින් යුතුව 2019.01.05 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සඳහා හංවැල්ල තාක්ෂණ නිලධාරී විසින් ඉවත් කළ යුතු ටෙලිෆෝන් කණු 10 ක් පමණ ඇති මෙම මාර්ගයේ ශ්‍රී ලංකා ටෙලිකොම් පුද්ගලික සමාගමෙන් එවා ඇති ලිපියේ ඇස්තමේන්තු මුදල බදු සහිතව රු.121,732.64 ලෙස සඳහන්ව ඇතත් ගලවා නැවත ස්ථානගත කරනු ලබන කණු ප්‍රමාණය දක්වා නොමැති බවට වාර්තා කර ඇති අතර ශ්‍රී ලංකා ටෙලිකොම් පුද්ගලික සමාගමෙන් ලබාදී ඇති ඇස්තමේන්තුව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමටත් අදාල දුරකතන කණු ගලවා නැවත ස්ථානගත කරන ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් පුද්ගලික සමාගම වෙත දන්වා යැවීමටත් තීරණය කරන ලදි.

7. 2019.01.24 දින පැවති කාරක සභාවේ තීරණ අංක 02 – (04) යටතේ දැක්වෙන තුම්මෝදර, වග - දකුණ, අංක 245 හි පදිංචි රංජිත් පියරත්න මහතා විසින් "බෝක්කුවක් කඩාවැටීම නිසා මාර්ගය අවහිරවීම" යන හිසින් යුතුව 2018.12.06 දිනැතිව යොමුකරන ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා විසින් 2019.01.10 දින සභාගත කරන ලද ලිපිය සඳහා පාදුක්ක තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව මෙම මෙම මාර්ගය සභාව සතු නොවන බැවින් ඇස්තමේන්තු සකස් කර පළාත් සභා ප්‍රතිපාදන මඟින් සකස් කරගැනීමට පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා වෙත දන්වා යැවීමට තීරණය කරන ලදි.

8. 2019.01.24 දින පැවති කාරක සභාවේ තීරණ අංක 02 – (06) යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. විමල් ප්‍රසන්න මැතිතුමා විසින් "මාර්ගයක් නම් කිරීම සම්බන්ධවයි" යන හිසින් යුතුව 2019.01.22 දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා කොස්ගම තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව මාර්ග ගැසට් පත්‍රයේ අංක 338 හි දැක්වෙන ඇස්වත්ත මිරිස්වත්ත පාර හා හයිලෙවල් පාර අතර වැටී ඇති දිගින් 1.7km හා පළල 4.5 m වන (හිඟුරල දිගපොත පාර නිමින්) මාර්ගය අදාල ලිපිලේඛන සම්පූර්ණ කළ පසු කොට්ඨාශභාර මන්ත්‍රීතුමා මඟින් මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදි.

9. **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (08)** යටතේ දැක්වෙන පාදුක්ක, ගලගෙදර, පාදුක්ක ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාශය, ගලගෙදර උතුර වසම, අංක **452/ඒ** හි පිහිටි ග්‍රාම සංවර්ධන සමිතිය විසින් "ආරක්ෂක දර්පන දෙකක් ලබාගැනීම" යන හිසින් යුතුව **2019.01.21** දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා පාදුක්ක තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව සීතාවක ප්‍රාදේශීය සභාව සතු මෙම මාර්ගයේ වංගුව සහිත පළල **4.0 m** පමණ ප්‍රදේශයේ එම පිහිටීම නිසා ඉදිරියෙන් පැමිණෙන වාහන නිසි පරිදි නොපෙනෙන බැවින් මේ සඳහා ඇස්තමේන්තු සකස් කර මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත යොමුකිරීමට තීරණය කරන ලදි.

10. **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (10)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා විසින් "පිටුම්පේ ප්‍රජා ශාලාවෙහි අළුත්වැඩියාව සම්බන්ධවයි" යන හිසින් යුතුව **2019.01.10** දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය සඳහා පාදුක්ක තාක්ෂණ නිලධාරී වාර්තාව සලකා බලා මෙම ඉඩම සභාව සතු බැවින් සකස් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත යොමුකිරීමට තීරණය කරන ලදි.

11. **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (11)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් "මාර්ගයක් සීතාවක ප්‍රාදේශීය සභාවට පැවරීම සම්බන්ධවයි" යන හිසින් යුතුව **2019.01.24** දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා පාදුක්ක තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව සීතාවක ප්‍රාදේශීය සභාව සතු ගල්කඩුව මාර්ගයෙන් ආරම්භ වී කොන්ක්‍රීට් මාර්ගයකින් අවසන් වන මෙම මාර්ගය අවශ්‍ය ලිපිලේඛන සම්පූර්ණ කළ පසු මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කර පවරා ගැනීමට තීරණය කරන ලදි.

12. **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (12)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් "සිරිසුමන මාවත ප්‍රධාන පාලමෙහි ආරක්ෂිත වැටක් ඉදිකර ගැනීම පිණිසයි" යන හිසින් යුතුව **2019.01.24** දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා පාදුක්ක තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව ඇස්තමේන්තු සකස් කිරීමට තීරණය කරන ලදි.

13. **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (13)** යටතේ දැක්වෙන "ජනසවි මාවත අවහිර කිරීම" යන හිසින් යුතුව **2018.12.23** දිනැතිව ලබාදුන් ලිපියට අදාලව සීතාවක ප්‍රාදේශීය සභාව මඟින් **2018.10.19** දින ඩී.ජී. සංජීව නැමති අය වෙත යවන ලද ලිපියේ පිටපතක් ලැබුණු නමුත් මාර්ගයේ අවහිරතා ඉවත් කර නොමැති බැවින් ඉවත්කිරීමට කටයුතු කරදෙන ලෙස ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන් චන්දන සූරියආරච්චි මැතිතුමා විසින් **2019.01.10** දින සභාගත කරන ලද ලිපිය සම්බන්ධයෙන් පවත්වන ලද ස්ථානීය පරීක්ෂණයේදී ගත් තීරණය පෙරදී දැනුම් දී ඇති අතර ඒ අනුව කටයුතු කරන ලෙස නැවතත් ඩී.ජී. සංජීව මහතා වෙත දන්වා යැවීමට තීරණය කරන ලදි.

14. **2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (14)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් "පොදු ළිඳක් ඉදිකිරීම පිණිසයි" යන හිසින් යුතුව

**2019.01.24** දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා පාදුක්ක තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව ළිඳක් ඉදිකිරීම සුදුසු වන අතර පරිත්‍යාග කරන ලද ඉඩම් කොටසේ මැනුම් කටයුතු කර පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට තීරණය කරන ලදි.

**15. 2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (15)** යටතේ දැක්වෙන **"**මීපේ පිහිටි කාණු පද්ධතියක් අවහිරවීම සම්බන්ධයෙන් විසඳුමක් ලබාගැනීම උදෙසායි.**"** යන හිසින් යුතුව **2019.01.22** දිනැතිව යොමුකරන ලද ලිපිය සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණයක් පවත්වන ලද අතර එහිදී අදාල පාර්ශවයන් කැඳවා සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය කරන ලදි.

**16. 2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (16)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා විසින් **"**මාර්ගයක් අවහිර කිරීම**"** යන හිසින් යුතුව **2019.01.24** දිනැතිව යොමුකරන ලද ලිපිය සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණයක් පවත්වන ලද අතර එම මාර්ගය ගැසට් පත්‍රයේ සඳහන් මාර්ගයක් ද යන්න පරීක්ෂා කර බලා තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

**17. 2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (17)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස්මැතිතුමා විසින්**"**මාර්ගය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම.**"** යන හිසින් යුතුව **2019.01.24** දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා කොස්ගම තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව පැවරුම් කිරීමට එකඟතාවය පළකර ඇති නමුත් ඔප්පු සාධන පත්‍ර ලබා දී නොමැති බැවින් අදාල ලිපිලේඛණ සම්පූර්ණ කළ පසු පැවරුම් කටයුතු කිරීමට තීරණය කරන ලදි.

**18. 2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (18)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමනී ස්වර්ණලතා මැතිතුමිය විසින් **"**පාරක් පවරා ගැනීම සම්බන්ධවයි.**"** යන හිසින් යුතුව **2019.01.18** දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා හංවැල්ල තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව මාර්ගය පැවරීම සඳහා අවශ්‍ය ලිපිලේඛණ සම්පූර්ණ කළ පසු මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි.

**19. 2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (19)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමනී ස්වර්ණලතා මැතිතුමිය විසින් **"**පාරක් පවරා ගැනීම හා සම්බන්ධවයි.**"** යන හිසින් යුතුව **2019.01.18** දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා හංවැල්ල තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව මාර්ගය පැවරීම සඳහා අවශ්‍ය ලිපිලේඛණ සම්පූර්ණ කළ පසු මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි.

**20. 2019.01.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **02 – (20)** යටතේ දැක්වෙන ගරු ප්‍රාදේශීය සභා උපසභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා විසින් **"**පෞද්ගලික මාර්ගයක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සම්බන්ධව**"** යන හිසින් යුතුව **2019.01.10** දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා පාදුක්ක

**තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව මෙම මාර්ගය භාවිත කරන්නෙකු වන එස්. චින්තන ශිරන්ත මහතා මෙම මාර්ගය සභාවට පැවරීමට අකමැති බව වාචිකව පවසන ලද අතර ඔහු අවශ්‍ය ලිපිලේඛණ ඉදිරිපත් කර නොමැති බැවින් මේ පිළිබඳව ගරු උපසභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා දැනුවත් කිරීමට තීරණය කරන ලදි.**

**21. 2019.01.24 දින පැවති කාරක සභාවේ තීරණ අංක 02 – (21) යටතේ දැක්වෙන ගලගෙදර නැගෙනහිර කොටිගලහේන ප්‍රජාශාලා ප්‍රධාන මාර්ගයේ දෙවන අතුරු මාර්ගයේ ජනතාව විසින් "ගලගෙදර නැගෙනහිර කොටිගලහේන ග්‍රාමයේ අතුරු මාර්ග ප්‍රාදේශීය සභාවට පවරාගෙන අවශ්‍ය සංවර්ධන කටයුතු කරදෙන ලෙස ඉල්ලීමයි." යන හිසින් යුතුව 2018.12.05 දිනැතිව යොමුකරන ලද ලිපිය සඳහා පාදුක්ක තාක්ෂණ නිලධාරී ලබාදුන් වාර්තාව අනුව මෙම මාර්ගයේ මුල් කොටස සභාවට පවරා නොමැති බැවින් එම කොටස සභාවට පැවරීමට කටයුතු කිරීමෙන් පසුව මෙම මාර්ගය පැවරීමට අදාල ලිපිලේඛණ සම්පූර්ණ කළ පසු පවරා ගැනීමට තීරණය කරන ලදි.**

## 02. <u>ලිපි ලේඛන සලකා බැලීම.</u>

**1. හංවැල්ල, කළුඅග්ගල, කිස්සියාවත්ත, සිරි උපෝසථාරාමය විහාරාධිපති පූජ්‍ය කහහේනේ ධම්මාලංකාර හිමියන් විසින් 2019.01.27 දිනැතිව කුඩාගොඩැල්ල ගමට ඇතුල්වන කුඩාගොඩැල්ල පාර මීට පෙර විහාරාධිපතිව වැඩ සිට අපවත්වී වදාල කළුඅග්ගල ශ්‍රී රතනාලංකාර මාහිමි පාණන් වහන්සේගේ නමින් "ශ්‍රී රතනාලංකාර මාහිමි මාවත" නම් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක් ද සමඟ ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා හංවැල්ල තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.**

**2. පාදුක්ක, මාවතගම, වෙන්දේසි වත්ත, රිටිගහහේන පාර පිහිටි එක්සිත් අන්‍යොන්‍යාධාර හා අවමංගල්‍යාධාර සුභසාධක සමිතිය විසින් "මාර්ගයක අවහිරතා වූ විදුලි හා දුරකථන කණු ඉවත්කර ගැනිම පිළිබඳවයි." යන හිසින් යුතුව 2019.02.07 දිනැතිව මාවතගම රිටිගහහේන මාර්ගයේ බෙනරගම මහතාගේ ඉඩමෙන් ලබාදුන් ඉඩකඩ නිසා මාර්ගය පුළුල් වී ඇති නමුත් පැවති විදුලි හා දුරකථන කණු එලෙසම පවතින බැවින් ඒවා මාර්ගය අයිනට සිටුවා දෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් හා ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.**

**3. පුවක්පිටිය, තුම්මෝදර පාර, 9 කණුව අසල හි පදිංචි කේ.ඒ. කල්‍යාණ මහතා විසින් "අනතුරුදායක ළිඳකට පිළියමක් කිරීම සම්බන්ධවයි" යන හිසින් යුතුව 2019.02.11 දිනැතිව ඉහත ලිපිනයැති ඉඩමට ආසන්නව පිහිටි අවුරුදු 20 ක් පරණ ළිඳ වටේටම පස් කණ්ඩි කඩා වැටෙමින්**

**4. කොස්ගම, බොරලුගොඩලන්ද ප්‍රදේශවාසීන් විසින් "අබලන්වී ඇති බෝක්කුව පිළිසකර කර ගැනීම." යන හිසින් යුතුව 2019.02.13 දිනැතිව බොරලුගොඩලන්ද අතුරු මාර්ගයේ (ඔබතුමාගේ ප්‍රතිපාදන**

වලින් ගල් අතුරා තාර දැමූ මාර්ගයට සම්බන්ධ 1 වෙනි අතුරු මාර්ගයේ) බෝක්කුව කැඩී ගොස් ඇති නිසා මාර්ගයේ ගමන් කිරීමට අපහසු බැවින් බෝක්කුව පිළිසකර කරදෙන ලෙස ඉල්ලමින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ද සමඟ යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා කොස්ගම තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

5. ඌරුවල ගම්වාසීන් විසින් 2019.01.22 දිනැතිව "ප්‍රාදේශීය සභාවට පාරක් පැවරීම" යන හිසින් යුතුව ඌරුවල කහපොල මාර්ගයේ සිට අළුබෝගහ හේන හරහා ඌරුවල කුඹුර දක්වා ඇති පළවන මාර්ගය සීතාවක ප්‍රාදේශීය සභාවට පවරාදීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමඟ යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

6. පාදුක්ක, බෝපේ, ගුරුලාන, 458/බී හි පිහිටි ග්‍රාම සංවර්ධන සමිතිය විසින් "ගම්බද මාර්ගයක් ප්‍රාදේශීය සභාවට ලියාපදිංචි කිරීම." යන හිසින් යුතුව 2019.02.04 දිනැතිව ගුරුලාන ග්‍රාමසේවා වසමට අයත් එගොඩ ගුරුලාන ජනපදයේ පාරක් ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලමින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සමඟ යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා විසින් "සංශෝධනය කිරීම සඳහා" යන හිසින් යුතුව 2019.02.21 දිනැතිව සාලාව රණවිරුගම මාර්ගයේ මුල් කොටස තාර දමා සංවර්ධනය සඳහා යොමු කර ඇති ලිපිය නැවත වෙනස් කර එම මාර්ගයේ මුල් කොටස කොන්ක්‍රීට් දමා සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා කොස්ගම තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

8. අකරවිටි, ආනන්දගම, අංක 50 හි පදිංචි එස්.ඩබ්. වසන්ත මහතා විසින් "කාණු පද්ධතිය සකස් කරගැනීම සම්බන්ධවයි" යන හිසින් යුතුව 2019.02.08 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් මැතිතුමා වෙත යොමුකරන ලදුව එතුමා විසින් ආනන්දගම 2 වෙනි පටුමගෙහි පිහිටි නිවාස 06 ක් අසලින් වර්ෂා කාලයට ගලා බසිටන ජල පහර ඉහත නම් සඳහන් අයගේ ඉඩමේ මුළුතැන්ගෙය අසලින් ගලා බැසීම හේතුවෙන් මුළුතැන්ගෙය ස්ථිර ලෙස සාදාගත නොහැකිව ඇති බැවින් ජලය ගලා බැසීමට ක්‍රමවත් කාණු පද්ධතියක් සකස් කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා කොස්ගම තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

9. පාදුක්ක, අංගමුව, කණුකැටිය, අංක 163/බී හි පදිංචි එම්.ඩී. ගුනපාල මහතා විසින් " ක්‍රීඩා භූමියක් සකසා ගැනීම සම්බන්ධයෙනි." යන හිසින් යුතුව 2019.01.20 දිනැතිව කණුකැටිය ගමෙහි ප්‍රයිම් ලෑන්ඩ්සේල් පුද්ගලික සමාගම විසින් ඉඩම් වෙන්දේසි කිරීමේදී පොදු කටයුතු සඳහා වෙන් කරන ලද

බිම් කොටස වල් බිහිවී ඇති බැවින් දරුවන්ට ක්‍රීඩා කිරීම සඳහා සුදුසු පරිදි සකස් කරදෙන ලෙස ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා වෙත යොමුකරන ලදුව එතුමා විසින් 2019.02.11 දින සභාගත කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**10.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා විසින් "උත්තල දර්පනයන් සවිකර ගැනීම සඳහා" යන හිසින් යුතුව 2019.02.23 දිනැතිව අකරවිට බොල්ලතාව පාර කළුඅග්ගල සිට අකරවිට බොල්ලතාව පාර (අකරවිට හංදිය ජයපාල මහතාගේ නිවස අසල තුංමං හන්දිය අසල) උත්තල දර්පනයක් සවිකර දෙන ලෙසත් හංවැල්ල පාලම කැඩීයාම හේතුවෙන් මෙම පාරේ වාහන ගමන් කිරීම වැඩිනිසා ඉතා ඉක්මණින් සවිකර ගැනීමට අවශ්‍ය බවත් දක්වමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා කොස්ගම තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**11.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා විසින් "ඇස්තමේන්තුවක් සකසා මුදල් වෙන්කරගැනීම සඳහා" යන හිසින් යුතුව 2019.02.23 දිනැතිව සාලාව වත්ත ප්‍රධාන මාර්ගය ෆැක්ටරිය අසල සිට ප්‍රධාන පාර තාර දමා සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා කොස්ගම තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**12.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් "පොදු පහසුකම් සඳහා වෙන්කළ කොටසේ වැටක් ඉදිකිරීම සඳහා" යන හිසින් යුතුව 2018.11.30 දිනැතිව දිද්දෙණිය දකුණ ග්‍රාමසේවා වසමේ අගල කැපූහේන මුරුතගස්පිටියේ තැන්නපිටහේන නැමති ඉඩම වෙන්දේසි කිරීමේදී පොදු පහසුකම් සඳහා පී.එච්. පෙරේරා බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන වෙන්කර ඇති පර්. 13.5 ක ප්‍රමාණයෙන් පර්චස් 06 ක ප්‍රමාණයක් යාබද ඉඩම් හිමිකරු විසින් අත්පත් කරගෙන තිබුණත් තාක්ෂණ නිළධාරී මහතා ඉදිරියේදී මැනුම් කටයුතු කිරීමේදී ලබාදී ඇති බැවින් ඉඩම් කොටස වෙන් කිරීම සඳහා කොන්ක්‍රීට් කණු හෝ සිටුවා වැටක් සකස් කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා හංවැල්ල තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**13.** හංවැල්ල, පහත්ගම, අංක 222 හි පදිංචි පී.ඒ. ජගත් ප්‍රේමාල් මහතා විසින් "හයිලෙවල් පාරේ වැසි ජලය ඉඩමට ගලා ඒම සම්බන්ධවයි." යන හිසින් යුතුව 2019.02.21 දිනැතිව ඔහුට අයත් ඉඩමට පාරේ සිට ගලන වැසි ජලය දෙපසින් ගලා එන බවත් පහත්ගම බෝධිය අසල සිට ඇති සියලු ඉඩම් පාර් මට්ටමට ගොඩකිරීමට මෙයට හේතුව බවත් දක්වමින් ජලය ඔහුගේ ඉඩමට ගලා ඒම වැළැක්වීමට පිළියමක් යොදන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා හංවැල්ල තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා විසින් 2019.02.21 දිනැතිව අලුත්අම්බලම ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලයට සහ බැරේගල ප්‍රධාන මාර්ගයට පිවිසෙන ප්‍රධාන මාර්ගයත්, දුම්රිය මාර්ගයත් අතර ඇති කාණු පද්ධතියේ කොන්ක්‍රීට් ලැලි කැඩීයාම නිසා අනතුරුදායක තත්වයක් තිබෙන බැවින් සකස් කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා කොස්ගම තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා විසින් "සඳරැස ප්‍රගතිමාවත සීතාවක ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම" යන හිසින් යුතුව 2019.02.21 දිනැතිව 428 සී මිරිස්වත්ත ග්‍රාම නිළධාරී වසමේ මිරිස්වත්ත, කොළඹ අවිස්සාවේල්ල මහා මාර්ගයේ පළමු දුම්රිය හරස් මාර්ගයට වම් පසින් ආරම්භ වන ප්‍රධාන මාර්ගය, එල්.වී.ඩී.එල්.ඩබ්. සමරසිංහ මහතාට අයත් ඉඩමේ දකුණු පසින් ආරම්භ වන පළමු පටුමග සහ "සඳරැස ප්‍රගති මාවත" අවසානයේ පදිංචි චමිල ආරියවංශ මහතාගේ පුද්ගලික නිවස ඉදිරිපිට වම්පසින් ආරම්භ වන 2 වන පටුමග සීතාවක ප්‍රාදේශීය සභාව පවරාගෙන සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා කොස්ගම තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා විසින් "පොදු නාන ලිඳ ප්‍රතිසංස්කරණය" යන හිසින් යුතුව 2019.02.20 දිනැතිව වල් බිහි වී ඇති පොදු නාන ලිඳ ප්‍රදේශයේ ජනතාවට පරිහරණය කිරීමට සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලමින් ප්‍රදේශවාසීන් ලබාදෙන ලද අත්සන් සහිත ඉල්ලීම් ලිපිය ද සමඟ යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

17. ප්‍රදේශවාසීන් විසින් "වග, පොල්හේන පාර ප්‍රධාන මාර්ගය හා දෙපස කාණු පද්ධතිය පිළිසකර කරගැනීම" යන හිසින් යුතුව 2018.02.01 දිනැතිව ලබුගම - කොළඹ ප්‍රධාන මාර්ගයේ සිට සාලාව දක්වාම ඇති අතුරු මාර්ගය දෙපස කාණු පද්ධතිය නිසි ලෙස නඩත්තු නොකිරීමෙන් වැසි ජලය මාර්ගය හරහා ගලායාම නිසා භාවිතා කිරීමට අපහසු බැවින් ප්‍රදේශවාසීන් විටින් විට ඒ සඳහා පිළිසකර කිරීම් සිදුකළ ද ඒ සියල්ල අපතේ යන බැවින් කාණු පද්ධතිය පිළිසකර කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා කොස්ගම තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා විසින් "සභාවට අයත් මාර්ගයේ පාලම් බෝක්කුව පළල් කරගැනීම" යන හිසින් යුතුව 2019.02.22 දිනැතිව අරුක්වත්ත (ජයසුන්දර පෙදෙස) මොරගහතැන්න පන්සල අසලින් ආරම්භ වන පන්සල පාර මීටර් 500 ක් පමණ දුරින් හේමන්ත මහතාගේ ඉඩම කෙළවර (අංශක 90 කට) හැරවුමක ඇති බොක්කු පාලම දමා ඇති ස්ථානය පටුවීම හේතුවෙන් වාහන හරවා ගැනීම සම්බන්ධව ගැටළු පැන නැගී ඇති බැවින් බෝක්කු පාලම විශාල කරගැනීමට අවශ්‍ය කටයුතු සලසාදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක

සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**19.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා විසින් **"පාරක් සභාවට පවරා ගැනීම සම්බන්ධවයි"** යන හිසින් යුතුව **2019.02.22** දිනැතිව පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ **460** ඒ ග්‍රාම සේවක වසමේ අරුක්වත්ත ජයසුන්දර පෙදෙසේ ආරාම පාරේ **1** වන පටුමග **(**මොරගහලන්ද ඉඩමේ පාර**)** සීතාවක ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලමින් අවශ්‍ය ලිපිලේඛන ද සමඟ යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**20.** හංවැල්ල, බඳුවත්ත, ගෙපල්ලමුල්ල පාර, **209/3** හි පදිංචි ටී.ඒ. දීපිකා ප්‍රියදර්ශනී මහත්මිය විසින් **"නිවසට අවහිර වන පරිදි තනා ඇති ගල්වැටිය සම්බන්ධව"** යන හිසින් යුතුව **2019.02.10** දිනැතිව ටොප්‍රිකල් ඇක්වා **(**පුද්**)** සමාගම විසින් ඉඩමේ මායිමත් ඇල මාර්ගයත් අවහිර වන පරිදි කිසිඳු අවසරයකින් තොරව ගල්වැටියක් සෑදීම නිසා ඇලෙන් පිටාර ගලන ජලය බැසයාමට ඇති මාර්ගය අවහිර වීමෙන් නිවස ජලයෙන් යටවන බැවින් මෙම ගැටළුව විසඳා දෙන ලෙසත් ඇල මාර්ගයට ඉදිරියෙන් ඇති කඳු වැටියේ පස් සෝදාගෙන ඇවිත් ඇලට ගොඩවී ඇති බැවින් එය ද පිළිසකර කරදෙන ලෙස ඉල්ලමින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා හංවැල්ල තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**21. 2018.12.24** දින පැවති කාරක සභාවේ තීරණ අංක **01 – (04)** යටතේ දැක්වෙන වග, කළුඅග්ගල, ජනසවි මාවත, **308/**ඒ හි පදිංචි ජී.වී. ජයවර්ධන මහතා විසින් **"අනතුරුදායක ගල් බැම්මක් සම්බන්ධවයි"** යන හිසින් යුතුව **2018.10.29** දිනැතිව යොමුකරන ලද ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණ නිළධාරී වාර්තා ලබාගෙන පුද්ගලිකව නඩු මාර්ගයෙන් විසඳා ගතයුතු බවට තීරණය කර ඇති අතර නැවතත් මේ සම්බන්ධයෙන් ඉල්ලීම් ලිපියක් ලැබී ඇති බැවින් මේ සඳහා ස්ථානීය පරීක්ෂණයක් පැවැත්වීමට කාරක සභාව තීරණය කරන ලදි.

**22.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ප්‍රසන්න මැතිතුමා විසින් **"පාර ප්‍රතිසංස්කරණය කරගැනීම සඳහා"** යන හිසින් යුතුව **2019.02.19** දිනැතිව වග ඉරිදාපොළ පරණ පාලම අසලින් පටන්ගෙන හල්පෙවත්තට යාමට ඇති කෙටිම මාර්ගය සඳහා එක් පසෙක කඩුවෙල, පහළ බෝමිරිය, අංක **95/4** කරල්ගහහේන පාර ලිපිනයෙහි පදිංචි වඩුවරා කන්නාමලාගේ ලලනි මංගලිකා නැමති අය විසින් පෙර දී පාරට අඩි **06** ක් වෙන්කර මැනුම් කර ඉඩම් කොටස් විකුණූ නමුත් නැවත මැනුම් කිරීමේදී පාරට වෙන්කර නොමැති අතර පෙරදී වාහන ගිය මෙම මාර්ගය සේදී අබලන් වී ඇති බැවින් කුඩා වාහනයකට වුව යා නොහැකි බැවින් වඩුවරා කන්නාමලාගේ ලලනි මංගලිකා නැමති අයගේ ඉඩමෙන් අඩි **2** ක් ලබාගෙන පාර සභාවට පවරාගෙන සකස් කරදෙන ලෙස ඉල්ලමින් අත්සන් ද සමඟ යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් පාර්ශවකරුවන් කැඳවා සාකච්ඡා කිරීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**23.** ප්‍රදේශවාසීන් විසින් "පොදු මාර්ගය සංවර්ධනය සිදුකර ගැනීම" යන හිසින් යුතුව **2019.02.17** දිනැතිව බෝපේ පිහිටි "මුත්තෙට්ටුව වත්ත" (රතුගම මාවත **1** පටුමග) මාර්ගය කිසිඳු අවස්ථාවක සංවර්ධනය වී නොමැති අතර මේ වනවිට ඉතා අබලන් තත්වයට පත්ව ඇති බැවින් මෙම මාර්ගය සීතාවක ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලමින් අත්සන් ලේඛණයක් ද, අංක **3284/9000** පිඹුරේ පිටපතක් ද සමඟ යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා පාදුක්ක තාක්ෂණ නිළධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදි.

**24.** **2018.07.23** දින පැවති කාරක සභාවේ තීරණ අංක **01 – (33)** යටතේ දැක්වෙන කරුණ සම්බන්ධයෙන් කෝට්ටේ, බැද්දගාන පාර, අංක **06** ලිපිනයේ පදිංචි සිරිල් චන්දන පෙරේරා මහතා වෙත අංක ම.හ.පැ./**2018** යටතේ **2019.01.08** දිනැතිව සභාපති, සීතාවක ප්‍රාදේශීය සභාව, හංවැල්ල විසින් යවන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, එකී ලිපියේ සඳහන් ප්‍රකාරව සිරිල් චන්දන පෙරේරා මහතා කටයුතු කර නොමැති බැවින් බැම්ම සිදුරු කර ජලය බැස්සවීමට තීරණය කරන ලදි.

**25.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා විසින් **2018.07.10** දින සභාගත කරන ලද කොස්ගම කොට්ඨාශයේ කනම්පැල්ල බටහිර ග්‍රාම නිළධාරී වසමේ කනම්පැල්ල කොස්ගම ප්‍රධාන මාර්ගයේ කනම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලයේ සිට කනම්පැල්ල දෙසට මාර්ගයේ දකුණු පසට ඇති දෙවෙනි මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධන කර ඇති අතර ඒ සඳහා නමක් නොමැති බැවින් එම මාර්ගයේ පදිංචිව සිට යුධ සමයේදී කිලිනොච්චි ඉදිරි ආරක්ෂක වළල්ලේදී රට දැය වෙනුවෙන් දිවි පිදූ රණවිරු අජිත් ඉන්දික කුමාර මහතාගේ නමින් "රණවිරු අජිත් ඉන්දික කුමාර මාවත" ලෙස නම් කරන ලෙස ඉල්ලමින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනය ද, ඉල්ලීම් ලිපිය ද, මියගිය බව දැන්වීමේ ලිපියක් ද සමඟ ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සඳහා තාක්ෂණ නිළධාරී වාර්තාව අනුව සභාව සතු පාරක් නොවන බැවින් ඉල්ලීම ඉටුකළ නොහැකි බව දන්වා යැවීමට තීරණය කරන ලදි.

**26.** සීතාවක ප්‍රාදේශීය සභාව මඟින් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රමදාන වැඩසටහන **2019** වර්ෂයේ මාර්තු මාසයේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන දිනයන් පහත පරිදි ඉදිරිපත් කර ඇති අතර මේ අනුව අදාල මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කර ශ්‍රමදාන වැඩසටහන සාර්ථකව ඉටුකිරීමට පියවර ගන්නා ලෙස වැඩ අධිකාරී, අදාල කාර්යභාර නිලධාරීන් හා කර්මාන්ත පරිපාලකවරුන්ට කාරක සභාව උපදෙස් ලබාදෙන ලදි.

| | | |
|---|---|---|
| **2019.03.03** | - | අශෝක වැලිකල මැතිතුමා |
| **2019.03.10** | - | සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමා |

## 03. <u>සාකච්ඡා සටහන්</u>

**1.** දුරකතන කණු සහ විදුලි කණු ඉවත්කිරීම සම්බන්ධයෙන් දිගින් දිගටම ඉල්ලීම් ලැබෙන අතර සභා ප්‍රතිපාදන මඟින් ඉවත් කිරීම කළ නොහැකි බැවින් ඉදිරියේදී පාරවල් සකස් කිරීම සඳහා සකස් කරනු ලබන ඇස්තමේන්තු වලට එම කණු ඉවත් කිරීම සඳහා වන වියදම ද ඇතුළත් කර සකස් කිරීමට සාකච්ඡා කරන ලදි.

අද දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීමේදී ගන්නා ලද ඉහත සඳහන් තීරණ ඇතුලත් කාර්මික සේවා කාරක සභා වාර්තාවට එකඟ වෙමින් පහත අත්සන් තබමි.

1.ගරු කාරක සභා සභාපති - ලියනගේ චන්දන කුමාර මැතිතුමා ..........

2.ගරු කාරක සභික - ජයන්ත රණවක මැතිතුමා ..........

3.ගරු කාරක සභික - සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා ..........

4.ගරු කාරක සභික - එල්.නන්ද කුමාරසිංහ මැතිතුමා ..........

5.ගරු කාරක සභික - පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා ..........

6.ගරු කාරක සභික - එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා ..........

7.ගරු කාරක සභික - කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා ..........

8.ගරු කාරක සභික - ඩබ්.අසෝක වැලිකල මැතිතුමා ..........

9.ගරු කාරක සභික - ජී. කුමුදිණි ජයවර්ධන මැතිතුමිය ..........

10.ගරු කාරක සභික - එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය ..........

කාරක සභාවේ වැඩ කටයුතු ප.ව. 02.30 ට පමණ නිමාවට පත්විය.

2019.02.22 වන දින
සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී.